# දරුවන් උදෙසා
# බයිබලයක්



# ගොවියා සහ
# බීජ

ඉදිරිපත් කරන්නා: Edward Hughes

නිදර්ශනය කරන්නා: M. Maillot; Lazarus
Alastair Paterson

සකස්කරන්නා: E. Frischbutter; Sarah S.

පරිවර්ථනය කරන්නා

නිෂ්පාදනය කරන්නා: Bible for Children
www.M1914.org

©2025 Bible for Children, Inc.
අවසරය : මෙම කථාන්තරය උපුටා ගැනිමට හෝ මුද්‍රණය කිරීමට අවසර
ඇතිමුත් එය විකිණීමට අවසර නැත.

එක් දිනක් ජේසුස් වහන්සේ
විලක් අද්දර ඉගැන්වූ සේක.
උන්වහන්සේට ඇහුම්කන් දෙනු
පිණිස විශාල ජනකායක් රැස්
වූවෝය.

ඔවුහු ඉතා විශාල ගනණක්
වූවෝය. ජේසුස් වහන්සේ
කුමක් කරන්නට ඇතිද?



අසළ තිබූ ඔරුවක් දුටු උන්වහන්සේ
එයට නැඟුනු සේක. දැන්
උන්වහන්සේට ඔවුන් සියලූ දෙනා
දකින්නටත්, ඔවුන්ට ජේසුස්
වහන්සේව දකින්ටත් අසන්ටත්
පුළුවන.



ජේසුස් වහන්සේ, දෙවියන් වහන්සේ ගැන
කියාදෙන සාමාන්‍ය දේවල්, උපමා කතා
භාවිතයෙන් උගන්වන්නට වූ සේක.



"ගොවියෙක් තම කෙතෙහි බීජ විසුරුවා හැරියේය." ජේසුස් වහන්සේගේ කතාව චිත්‍රයක් පමණක් නොවී වචන සහිත පින්තූරයක් මෙන් වූයේය.



ගොවියා වැඩ කරන ආකාරය, මිනිසුන්ට හිතින් මවාගත හැකි විය. ඔවුන් එය බොහෝ වතාවක් දැක තිබුණි.



විසුරුණු බීජ වලින් සමහරක්
අඩිපාරක වැටුනේය. කුරුල්ලෝ
ඒවා ගිල දැමීමට ඉක්මනින්ම
පහතට ආවෝය.



සමහර බීජ කුඹුරේ ගල් සහිත කොටස් මත පතිත විය. ඒවා ඉක්මනින් දිලිසෙන කුඩා පැළ බවට වර්ධනය විය. නොගැඹුරු පසෙහි මුල් බැස ගැනීමට නොහැකි වූ නිසා උණුසුම් හිරු ඉක්මනින් ඒවා වියළා දැමුවේය.



අනෙක් බීජ කටු අතර මුල් බැස තිබුණි. ඒවා ධාන්‍ය ලබාදුන්නේ නැත. අවශ්‍ය හිරු එළිය සහ වැස්ස අවහිර කරමින් ළපටි පැළ වටා කටු වැවෙන්නට විය.



ඉතිරි බීජ හොද බිමක වැටුණේය. කාලය
ගතවෙත්ම, රිකිලි, නිරෝගී පැළ බවට පත් වී
අලුත් ධාන්‍ය විශාල ප්‍රමාණයක් නිපදවීය. ගොවියා
බොහෝ සේ සතුටු වන්නට ඇත.



කතාව අවසානයේදී ජේසුස් වහන්සේගේ ගෝලයෝ උන්වහන්සේ වෙත ආවෝය. “ඔබ වහන්සේ උපමා වලින් කතා කරන්නේ ඇයිදැ” යි ඔවුහු ඇසුවෝය.



දෙවියන් වහන්සේට මිනිසුන් සැබවින්ම ප්‍රේම කරන්නේනම් ඔවුන්ට දෙවියන් වහන්සේ ගැන තේරුම් ගන්නට උපමා කතා උදව් වන බව ජේසුස් වහන්සේ කී සේක. දෙවියන් වහන්සේට ප්‍රේම නොකරන්නන්ට උපමා කතා තේරුම්

ගත නොහැකිය.




ජේසුස් වහන්සේ ඒ උපමාව පැහැදිලි
කළසේක. බීජ යනු දේව වචනය බව
උන්වහන්සේ කී සේක. අඩිපාර මත වැටුණු බීජ,
දේව වචනයට ඇහුම්කන් දුන්නද එය
තේරුම්
නොගන්නා
කෙනෙකුට
සමානය.
සාතන්
ඔවුන්ට
දෙවියන්
වහන්සේ කී
දේ අමතක
කරවන්නේය.


සමහරුන්ට දේවවචනය ඉක්මනින්ම
ලැබෙන්නේය. ඔවුන් ගල් පසෙහි වැටුණු බීජ
වැනිය. නමුත් ඔවුන් දෙවියන් වහන්සේට ප්‍රේම
කරන නිසා යමෙකු ඒ ගැන සමච්චල්
කලහොත් හෝ අපහසුතාවට
පත් කළහොත් හෝ ඉක්මනින්ම
කණගාටුදායක දෙයක්
සිදුවන්නේය.

ඔවුන් ප්‍රීතියෙන් යේසුස් වහන්සේ අනුගමනය කිරීම ආරම්භ කළත්, ඒ අයම දෙවියන් වහන්සේගේ වචනයට කීකරු වීම  නවත්වන්නෝය. දෙවියන් වහන්සේ අනුගමනය කිරීමේ මිල ගෙවීමට ඔවුන්ට අවශ්‍ය නැත. දෙවියන් වහන්සේ සතුටු කරනවාට වඩා මිතුරන් සතුටු කිරීමට ඔවුන්ට අවශ්‍ය වීම කෙතරම් කණගාටුදායකද?



උපමාවේ සඳහන් කළ කටු, ලෞකික කරදර සහ සමහර මිනිසුන්ගේ ජීවිත පුරවන මුදල් වලට ඇති ඇල්ම හා සමානය. ඔවුහු වැඩිපුර මුදල් සහ වෙනත් දේවල් ලබා ගැනීමට කොතරම් කායීබහුල වන්නේද යත්, දෙවියන් වහන්සේව තමුන්ගේ ජීවිතයෙන් ඉවත් කරන්නෝය.



නමුත් සරුසාර බිමේ වැටී හොඳ ඵලදාවක් ලබාදුන් බීජ, මිනිසුන්ගේ සිත් ඇතුළට ගොස් ඔවුන්ගේ ජීවිත වෙනස් කරවන දෙවියන් වහන්සේගේ වචනය හා සමානය. එවැනි පුද්ගලයෝ දෙවියන් වහන්සේට සේවය කරමින් ගෞරව කරන්නෝය.



මිනිසුන්ට පිටව යන්නට අවශ්‍ය නොවීය. බොහෝ දෙනෙකුට දෙවියන් වහන්සේ පසුපස යන්නටත් උන්වහන්සේ සතුටු කරන්නටත් අවශ්‍ය විය. ජේසුස් වහන්සේගේ උපමා කතාවන්, දෙවියන් වහන්සේට කීකරු වන ආකාරය තේරුම් ගන්නට ඔවුන්ට උදව් විය.



# ගොවියා සහ බීජ

**දේව වචනයෙන් එක් කථාවක්**

**බයිබලයේ**

ශු. මතෙව් 13

**"ඔබේ වචන පැහැදිලි වන විට ආලෝකය ලැබේ"**
**ගීතාවලිය** 119:130

# අවසානය

43

60

මෙම බයිබල් කථාන්තරය අපට පවසනුයේ, අප සෑදූ අපගේ මහෝත්තම දෙවියන් වහන්සේ පිළිබඳ දැනගෙන උන් වහන්සේ කව්දැ යි කියා හඳුනාගන්නා ලෙසයි.

දෙවියන් වහන්සේ විසින් පාපය යයි සලකන, අයහපත් දේ අප විසින් කර ඇති බව උන් වහන්සේ දන්නා සේක. පාපයට දඬුවම මරණයයි. එහෙත් දෙවියන් වහන්සේ අපට බොහො සේ ප්‍රේම කරන බැවින් උන් වහන්සේගේ එකම පුත්‍රයා අප වෙත එවූ සේක. ජේසුස් වහන්සේ කුරුසියේ වද වේදනා විඳිමින් ඔබේ පව් උදෙසා මරණයට පත් වු සේක. ජේසුස් වහන්සේ මරණයෙන් නැඟිට, තමාගේ නිවස වන ස්වර්ගයට ගිය සේක. ඔබ ජේසුස් වහන්සේ පිළිගෙන ඔබගේ පාපයට කමාව අයැදින විට උන් වහන්සේ ඔබට කමාව දෙන සේක. එවිට උන් වහන්සේ ඔබ සමඟ ජීවත් වනු ඇත. ඔබට ද සදාකල්හිම උන් වහන්සේ සමඟ ජීවත් විය හැක.

මෙම සත්‍යය ඔබ පිළිගන්නේ නම් ජේසුස් වහන්සේට මෙසේ පවසන්න.

ආදරණීය ජේසුස් වහන්ස, ඔබ වහන්සේ, දෙවියන් වහන්සේ බව මම විශ්වාස කරමි. ඔබ වහන්සේ මිනිස් බව ගෙන මාගේ පාපය වෙනුවෙන් දිවි පුදා දැන් නැවතත් ජීවමානව වැඩසිටින සේක. මගේ ජීවිතයට පැමිණ මාගේ පාප කමා කරන මෙන් ඉල්ලා සිටිමි. එවිට මට ඔබ වහන්සේ සමඟ අලුත් ජීවිතයක් ගතකිරීමට හැකි ය. ඔබ වහන්සේ සමඟ සදාකාල ජීවිතයට ද මට දිනක් උදා වනු ඇත. ආමෙන්.

දිනපතා බයිබලය කියවා දෙවියන් වහන්සේ සමඟ කතා කරන්න (ශු. ජොහන් 3:16)